# සම්මත සේවා ගිවිසුම

මෙම ගිවිසුම සිදුකර ඇත්තේ, ජාතික හැඳුනුම්පත් අංක / සමාගම් ලියාපදිංචි අංක ……………………………………………දරණ………………………………………………………………… ………………………………………………………………………...………...……………………………… සහ අංක 400, ගාලුපාර, කොළඹ 03 හි එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ් විසින් ………………… …………………………… දින අත්සන් තබන ලදී.

එන්.එස්.බී.ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්,2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ජනරජයේ විධිමත් ලෙස සංස්ථාපිත සමාගමක් වන PB 795 ලියාපදිංචිය සහිත අංක 400, ගාලුපාර, කොළඹ 03 හි එහි ලියාපදිංචි කාර්යාලය (මෙතැන්සිට "NSBFMC" ලෙස හැඳින්වේ). එන්.එස්.බී.ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පූර්ණ අනුබද්ධිත ආයතනයක් වන අතර ශ්‍රී ලංකා මහබැංකුවේ බලයලත් ප්‍රාථමික අලෙවිකරු සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ බලයලත් ණය බෙදාහරින්නා සහ තැරැව්කරු වේ. NSB FMC ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, ප්‍රති මිලදීගැනීමේ ගිවිසුම, ආයතනික ණයකර සහ භාරකාර සේවා සඳහා ආයෝජන සේවා සපයයි.

**අදාළ නීතිමය විධිවිධාන**

1923 අංක 8 දරණ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත (Local Treasury Bills Ordinance), 1937 අංක 7 දරණ ලියාපදිංචි කොටස් හා සුරැකුම්පත් ආඥාපනත (Registered Stock and Securities Ordinance), 1923 අංක 08 දරණ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනතෙහි 16 වන වගන්තිය යටතේ සම්පාදිත 2009 අංක 01 දරණ දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික වෙළෙඳුන්) රෙගුලාසි සහ 1937 අංක 7 දරණ ලියාපදිංචි කොටස් හා සුරැකුම්පත් ආඥා පනතෙහි 55 වැනි වගන්තිය යටතේ සම්පාදිත 2009 අංක 01 දරන ලියාපදිංචි කොටස් සහ සුරැකුම්පත්රෙගුලාසිය යන පණත් හා රෙගුලාසි වල විධිවිධාන ප්‍රකාරව.

**පොදු මූලධර්ම**

සමාගම එයට පැවරී ඇති අධිකාරී සීමාව තුල සිට, ගණුදෙනුකරුවන් සමඟ සිදුකෙරෙන සියළු ක්‍රියකාරකම් වලට අදාළව,

(අ) එහි ගණුදෙනු කරුවන් ගේ අභිලාෂ සහ වෙළඳපල අඛණ්ඩතාවය සාක්ෂාත් කිරීමෙහි ලා අවංකව, සාධාරණව සහ වෘත්තීය නිපුණතාවයෙන් යුතුව ක්‍රියාකරයි.

(ආ) එහි ගණුදෙනුකරුවන්ගේ අභිලාෂ මුදුන් පමුණුවාලීම සඳහා නිසි කුසලතාවයෙන්, පරීක්ෂාකාරීත්වයෙන් සහ උද්‍යෝගයෙන් යුතුව ක්‍රියාකරයි.

(ඇ) යම් ආයෝජනයක වාසි හෝ අවාසි පිළිබඳව අපරික්ෂාකාරීව නොසැලකිලිමත් ලෙස හෝ සිතාමතා ගණුදෙනුකරු නොමඟ යැවීමට කටයුතු නොකරයි.

(ඈ) ආයෝජනයට අදාළ තොරතුරු ගණුදෙනුකරුවන්ගෙන් අපේක්ෂා කරයි.

(ඉ) ගණුදෙනුකරු දැනුවත් කිරීම සඳහා සියළු ගාස්තු ඇතුළු අදාළ තොරතුරු සම්පූර්ණයෙන් අනාවරණය කරයි.

(ඊ) මත ගැටුම් වැළක්වීමට කටයුතු කරයි.

(උ) වේගවත්ව, කාර්යක්ෂමව හා සාධාරණව වැරදි නිවැරදි කිරීම හා ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි ආමන්ත්‍රණය කිරීම සිදුකරයි.

(ඌ) ගණුදෙනුකරු අනවශ්‍ය ලෙස පීඩාවට පත් කිරීම හෝ ඔහු/ඇය කෙරෙහි අනිසි බලපෑම් කිරීම සිදු නොකරයි.

(එ) යම් ආයෝජනයක් ඔස්සේ ගණුදෙනුකරුට ලැබෙන ප්‍රතිලාභ සම්බන්ධයෙන් එම ආයෝජනයේ සන්නාමය වැරදි සහගත අදහසක් ඇති නොකරන බව සහතික කරයි.

(ඒ) ගණුදෙනුකරු විසින් ලබාදෙන ලද සියළු උපදෙස් ක්ෂණිකව හා නිසි පරිදි ඉටු කෙරෙන බව සහතික කරයි.

(ඔ) යම් ගණුදෙනුකරුවකුගේ නමින් සමාගම වෙත ලැබුනු යම් මුදලක්, එම මුදල ලද දින, වැඩ කරන කාලසීමාව අවසානයේ එම ගණුදෙනුකරුගේ ගිණුමට බැර කෙරෙන බව සහතික කරයි.

(ඕ) ඇටෝර්නි බලපත්‍රයක් යටතේ ගණුදෙනුකරුවෙක් වෙනුවෙන් කටයුතු කරන පුද්ගලයෙක් සමඟ, සමාගම ගණුදෙනු කරන විට සමාගම;

- ඇටෝර්නි බලපත්‍රයේ සහතික කරන ලද පිටපතක් ලබාගනී.
- අදළ ඇටෝර්නි බලපත්‍රය යටතේ එම පුද්ගලයා ගණුදෙනුකරු වෙනුවෙන් කටයුතු කිරීමට අවස්ථාව සැලසෙන බව සහතික කරයි.
- ඇටෝර්නි බලපත්‍රයේ අන්තර්ගත සීමා තුල සිට කටයුතු කරයි.

**තොරතුරු සහ අදාළ විධිවිධාන**

(අ) යම් හෙයකින් සමාගම සිය මෙහෙයුම් නවතා දැමීම, තවත් සමාගමක් සමඟ ඒකාබද්ධ වීම හෝ එහි සියළු ක්‍රියකාරකම් හෝ ඉන් කොටසක් තවත් ප්‍රාථමික අලෙවිකරු වෙත පැවරීම යන අවස්ථාවලදී සමාගම;

- විකල්ප ක්‍රම වේදයකට එළඹීමේ අවස්ථාව ලබා දෙමින් අවම වශයෙන් මාස දෙකකට පෙර ගණුදෙනුකරු ඒ පිළිබඳව දැනුවත් කරයි.
- සියළු අසම්පූර්ණ ගණුදෙනු පියවන බව සහතික කරයි. නැතහොත් පවරාදීමෙන් හෝ එකාබද්ධ වීමෙන් පසු ගණුදෙනුවල අඛණ්ඩතාවය පිළිබඳව ගණුදෙනුකරු දැනුවත් කරයි.

(ආ) ගණුදෙනුකරු සමඟ විද්‍යුත් මාධ්‍යයක් ඔස්සේ සන්නිවේදනය කරන අවස්ථාවලදී ගණුදෙනුකරු වෙතින් ලබා ගන්නා තොරතුරු වල ආරක්ෂාව සැලසීම සහ ගණුදෙනුකරු වෙත සුරක්ෂිතව තොරතුරු සන්නිවේදනය කිරීම සඳහා නිසි වැඩපිළිවෙලක් පවතින බව සමාගම සහතික කරයි.

**ප්‍රාථමික අලෙවිකරුවකු වෙත ගණුදෙනුකරුවෙකුගේ වගකීම**

ගණුදෙනුකරු ඕනෑම අවස්ථාවක සම් බන් ධ කරගැනීමට සහසංයුක්ත තැටියේ අන්තර්ගත, ගණුදෙනුකරු ලියාපදිංචි කිරීමට අදාළ තොරතුරු කාලීන හා නිවැරදි බව තහවුරු කරගැනීමට හැකි වන පරිදි ගනුදෙනුකරු සිය ලිපිනයේ හෝ අනෙකුත් තොරතුරු වල සිදු වන ඕනෑම වෙනසක් පිළිබඳව සමාගම දැනුවත් කිරීමට කටයුතු කිරීම ඉතා වැදගත් වේ.

(අ) ගණුදෙනුකරු අදාළ ගිවිසුමට එළඹීමට පෙර ප්‍රාථමික අලෙවිකරු විසින් ලබාදෙනු ලබන නිමැවුම / සේවාව පිළිබඳව පූර්ණ අවබෝධයක් ඇති කර ගත යුතුය.

(ආ) ගණුදෙනුකරු,, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අදාළ අයදුම්පත්‍රය හා එහි සඳහන් කරුණු සනාථ කෙරෙන ලේඛණ සමාගම වෙත භාර දිය යුතුය.

**ගණුදෙනුකරුවන්ගේ ප්‍රඥප්තිය සමඟ අනුකූල වීම**

එන්.එස්.බී.ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ්, එහි ගණුදෙනුකරුවන් ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා සම්පාදිත සිය ගණුදෙනුකරුවන් ගේ ප්‍රඥප්තිය විසින් පාලනය කෙරෙන බවටත් එම ප්‍රඥප්තිය ශ්‍රී ලංකා මහබැංකුවේ නිල වෙබ් අඩවිය වන www.cbsl.lk මඟින් ප්‍රකාශයට පත් කර තිබෙන බවටත් සමාගම මෙයින් සහතික වෙයි.

සමාගමේ (එන්.එස්.බී.ෆන් ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ්) සම්මත සේවා ගිවිසුමෙහි පිටපතක් ලද බවට මම සහතික වෙමි.

……………………. ………………………………….

අයදුම්කරුගේ අත්සන බද්ධ අයදුම්කරුගේ අත්සන

දිනය :

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.**

ගණුදෙනුකරුගේ කේතය: ……………හඳුන්වා දෙන ලද්දේ: ……………….පරීක්ෂා කළේ: ……………….

ගණුදෙනුකරුගේ කේතය: …………… ශාඛා කේතය: ……………….........අනුමත කළේ:……………….